**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය යටතේ ගිණුම්ගත වියයුතු රු.451,385 ක වියදම් ප්‍රාග්ධන වැය යටතේ ගිණුම් ගතකර තිබුණු අතර, පරිගණක හා උපාංග වටිනාකම රු.2,756,098 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.13,076,355 ක් වූ මෝටර් රථ ප්‍රත්‍යාගණන පාඩුව හා වටිනාකම රු.328,000 ක් වූ ට්‍රේලර් 02 ක් ගිණුම් ගතකර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | පුනරාවර්තන වැය රු. 460,290 ක් ප්‍රාග්ධන වැය ලෙස සටහන් වීම නිවැරදි කිරීමේ දී ප්‍රාග්ධන වැය ගිණුමෙන් ඉවත් කිරීම වෙනුවට ස්ථාවර වත්කම් වලින් ඉවත් කර තිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | පළාත් විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු මුදල රු.4,422,644 ක් වූ අතර, එම මුදල වාරිකව ගෙවීමේ දී සමාලෝචිත වර්ෂයට අදාළ රු.500,000 ක මුදල ණයහිමි ගිණුම හර කරනු වෙනුවට වියදම් ගිණුම හර කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මූලා ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් එකතු කිරීම් ශේෂය හා ශුද්ධ වත්කම් ප්‍රකාශය අනුව ශේෂය අතර රු.115,376 ක වෙනසක් පැවති අතර ස්ථාවර වත්කම් එකතුව හා ප්‍රාග්ධන යෙදූමට ආදායමින් හා ආධාර මඟින් දායක වීමේ ගිණුම අතර ද රු.460,290 ක වෙනසක් පැවතුණි. | ජර්නල් සටහන් මඟින් ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුස්තකාල පොත් මිලදී ගැනීම්වල මූලා ප්‍රකාශනවල හා උපයෝගී ලේඛන අතර රු.267,250 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,287,409 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත හා 2021 ජූලි 08 දින නිකුත් කරන ලද අංක 2235/54 දරන අති විශේෂ ගැසට් පත්‍රය | මූලික සැලසුම් නිරාකරණය කිරීමට අදාළ පෙරසැරි ගාස්තු වන රු.90,000 ක් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | විදුලි සංදේශන හා නියාමන කොමිෂන් සභාවට තොරතුරු ඉල්ලා ලිපි යොමු කොට ඇති බව. | ගැසට් පත්‍රය ප්‍රකාර කටයුතු කළ යුතුය. |

**1.7.2 අධිකාරි බලය නොලත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 වර්ෂයේදී ලේකම් විසින් දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීම වාර 04 ක් සඳහා ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර ඉන්ධන වෙනුවෙන් රු.629,423 ක් ගෙවීම් කර තිබුණි. | සුදුසු වැඩපිළිවෙලක් ඉදිරියේ දී යොදන බව. | පිරිවැය අවම වන පරිදි වාහන භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,833,092 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.22,170,644 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,502,500 | 1,538,171 | 1,527,401 | 270,001 | 1,366,200 | 1,263,512 | 1,258,523 | 259,231 |
| කුලී | 6,631,360 | 6,349,958 | 2,659,260 | 4,570,543 | 6,329,690 | 6,628,251 | 7,884,299 | 879,845 |
| බලපත්‍ර ගාස්තු | 201,000 | 179,207 | 105,807 | 93,200 | 76,000 | 158,513 | 322,853 | 19,800 |
| වෙනත් ආදායම් | 15,384,000 | 13,982,055 | 13,192,465 | 2,496,248 | 8,397,000 | 11,719,688 | 12,678,231 | 1,706,658 |
| එකතුව | 23,718,860 | 22,049,391 | 17,484,933 | 7,429,992 | 16,168,890 | 19,769,964 | 22,143,906 | 2,865,534 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට මුළු හිඟ ආදායම රු.2,865,534 ක් වූ අතර, වර්ෂ අවසානයට එය රු.7,429,992 ක් විය. | අයවීම් වර්ධනය කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ග්‍රාම සේවා වසම් 42 කින් සමන්විත අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව වරිපනම් බදු අයකර සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ආරම්භ කොට ඉටු කරමින් පවතින බව. | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බටපොල හා මීටියාගොඩ බල ප්‍රදේශයන්හි පදිංචි අක්කර බදු හිමියන් 312 ක ගෙන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට වටිනාකම රු.259,188 ක් වූ හිඟ අක්කර බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට ලේඛන සකස් කර යොමුකර ඇති බව. | වර්ෂ ගණනාවක සිට හිඟව පැවත එන අක්කර බදු හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඈ) | ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 37 ක් වෙනුවෙන් රු.211,360 ක ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට සියළුම හිඟ මුදල අයකර අවසන් කර ඇති බව. | දැන්වීම් පුවරු ගාස්තු අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ රු.492,067 ක් හා මුද්දර ගාස්තු රු.20,432,979 ක් ලැබිය යුතුව තිබුණි. | 2024 වර්ෂයේදී අයවී අවසන්වී ඇති බව. | නියමිත දිනට හිඟ ආදායම් අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන වලට අනුකූල නොවන පරිදි 2020 හා 2021 වර්ෂයේ කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු රු.5,209,658 ක මුද්දර ගාස්තු අයකර ගැනීම වෙනුවෙන් සභාවේ ලේකම් ඇතුළු නිලධාරීන් 05 දෙනෙකු සඳහා දිරි දීමනා වශයෙන් සභා අරමුදලින් අවස්ථා 02 කදී රු.156,290 ක් ගෙවීම් කර තිබුණි. | තීරණ අංක 2023/05/19/128 අනුව ගෙවීම් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභා බල ප්‍රදේශයේ පාසල් දරුවන් හට අභ්‍යාස පොත් නොමිලේ බෙදා දීම වෙනුවෙන් සභා අරමුදලට ප්‍රසම්පාදනයේ දී රු.808,500 ක පාඩුවක් සිදුකර ගනිමින් මිලදී ගෙන තිබූ වටිනාකම රු.2,831,876 ක් වූ පොත් 21503 ක් බෙදා දීමට කටයුතු කිරීමකින් තොරව මාස 10 ක කාලයක් ගබඩාවේ පැවතිණි. | පළාත් පාලන මැතිවරණයට දින ප්‍රකාශ කිරීමත් සමඟ මැතිවරණ නීතිවලට එකඟව පොත් බෙදා දීම නතර කිරීම සිදු වී ඇති බව. | ප්‍රසම්පාදන නීති අනුව මිලට ගැනීම කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ අක්කර 36 රූඩ් 04 පර්චස් 9.33 ක් වූ ඉඩම් 03 ක් ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව වෙන්දේසි කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දැනුම් දෙන ලද අඩුපාඩු සම්පූර්ණ නොකිරීම මත අනුමැතිය ලබා දී නැති බව. | සභා අනුමැතිය අනුව කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු බිග්සිටි ජල ව්‍යාපෘතිය මඟින් පාරිභෝගිකයින් 22 ක් වෙත ජලය බෙදාහරිමින් පැවති නමුත්, ජල මීටර් සවිකර ගාස්තු අය කිරීමට සභාව ක්‍රියාකර නොතිබුණි. | ජල සාම්පල් පරීක්ෂාව සිදුකර එහි වාර්තාව ලැබෙන තෙක් ජල ගාස්තු අය කිරීම අප විසින් සිදු නොකරන ලද බව. | කඩිනමින් ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරනු ලබන හිමිකාරීත්වය සභාව සතු නොවන ඉඩම් 18 ක අයිතිය විධිමත්ව සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවරුම් නියෝග ලබා ගැනීම සහා ඉල්ලුම් කර ඇති බව. | ඉඩම් වල අයිතිය පවරා ගත යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රීන් ෆීල්ඩ් මාර්ගයේ පැති කාණුව සහ අලුත්වල පාසල අසළ මාර්ගයේ පැති කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම හේතුවෙන් රු.191,035 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන බව. | නියමිත මිල අනුපාත භාවිතා කර ගෙවීම් කල යුතුය. |
| (ආ) | දොඩන්දූව ගෙදර වත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ කාර්යයන් සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.178,760 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ ව න බව. | නියමිත මිල අනුපාත භාවිතා කර ගෙවීම් කල යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය, මිය ගිය හා සේවය හැර ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.91,394ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | ණය ශේෂ කපා හැරීමට සහ අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |